


**මා දන්නා තරමින් ඔබ බෙර වාදනයට ඉතා දක්ෂ ශිල්පිණියක්. නර්තනයට ඔබගේ පිවිසීම ගැන කතා කලොත්**

මා නර්තනය 'අ' යන්නේ සිට ඉතා හොඳින් හැදෑරූ කෙනෙක්. අවුරුදු 3 දී ආරම්භ කල මගේ ගමන අ.පො.ස. සාමාන්‍ය පෙළ, උසස් පෙළ හරහා විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා විහිදෙනවා. කැළණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයෙන් නර්තනය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලාව නිම-කොට විශේෂවේදී උපාධිය ලබාගත්තා. මීට අමතරව ගාන්ධර්ව, ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාගත්‍රයන් උඩරට නැටුම්, පහතරට නැටුම්, බෙරවාදන හා ජන ගායනා යන අංශවලින් සමත් වූවා.

**නර්තනයෙන් ඔබ ලැබූ සම්මාන හා සහතිකයන් මොනවාද ?**

නර්තන විෂය සම්බන්ධව මා ලැබූ සහතික හා කුසලාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. කෙටියෙන්ම කියනවානම් 1989 - 1991 වර්ෂයන් අතර පැවැත් වූ යෞවන සමාජ හා සමස්ථ ලංකා පාසල් නර්තන තරඟවලින් උඩරට නැටුම්, පහතරට නැටුම්, ජන නැටුම්, බෙරවාදන හා නව නිර්මාණ නැටුම් යන අංශවලින් සමස්ථ ලංකා ප්‍රථමස්ථාන රැසක් හිමිකර ගත්තා. මීට අමතරව නර්තනය නිසා මගේ ජීවිතයට හොඳ පන්නරයක් ලැබුනා.

**නර්තනයේ ශිල්ප හදාරා විවිධ තරඟයන් ජයග්‍රහණය කළ ඔබ දරුවන්ට ඔබේ දැනුම බෙදා-දෙන්නට පිවිසෙන්නනේ කෙසේද ?**

ප්‍රථමයෙන් මම නර්ථනය ඉගැන්වීමට පිවිසෙන්නේ මගේම පාසලේ ශිෂ්‍ය ගුරුවරයෙක් විදිහය ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලය මගේ පාසලයි. එහි එක්තරා කාල වකවානුවක නර්තන ගුරුවරුන් හිඟයක් පැවතුනා. මගේ දක්ෂතා දැනසිටි මගේම ගුරුවරු ඒ සඳහා මා යෝජනා කළා. පාසල් සංවර්ධන සමිතියේ ගෙවීමක් කොට මා ඒ සඳහා උදව් කර ගත්තා. එවකට මා උසස්පෙළ හදාරන සිසුවියක්. ඉන්පසු උසස් අධ්‍යාපනයෙන් පසු මොණරාගල තණමල්විල ජාතික පාසලේත්, මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයේත් ගුරුවරියක ලෙස මගේ දැනුම දරුවන්ට බෙදාදී ඔවුන්ට තරඟ හා විභාගවලින් උසස් ජය හිමිකොට දුන්නා. එමෙන්ම පංසිළු කලාකවය නමින් කලායතනයක් පවත්වාගෙන යාමටත් මා කටයුතු කළා.

**මෙල්බන්හි ප්‍රසංග සංවිධානය කරමින් නිරතුරුවම උසස් රස වින්දනයක් ප්‍රේක්ෂකයාට ලබාදෙන ඔබ මෙවර ප්‍රසංගයේදී සිදු කරන විශේෂතා මොනවාද ?**

මා ඇතුළු මාගේ සිසුවියන් මෙවර ප්‍රසංගය විශාල වෙනසකින් ඉදිරිපත් කරනවා. මෙවර සම්පූර්ණ ප්‍රසංගයම ගලා යන්නේ කතාවක් විදියට. ශ්‍රී ලංකීය රාජ වංශයේ ආරම්භය එනම් -විජය කුවේනී" පුරාවෘත්තය මා මීට පාදක කොට ගත්තා.

මහා වංශය පරිශීලනය කිරීහේදී කුවේණිය යකින්න-ක්. නමුත් නිර්මාණ කරුවෙක් විදියට හා දකින කුවේණිය එවකය යක්ෂයින් ඇදහූ මනුෂ්‍ය දුවක්. ඉතාම අලංකාර රූ සපුවක් සහිතව විශාල අධ්‍යාත්මික බලයක් තිබුණු, රාවණා පරපුරෙන් පැවත එන උදාර කාන්තාවක් විදියට මා මේ චරිතය ගොඩනගා තිබෙනවා.

-විජය කුවේණි" කතා ප්‍රවෘතිය අප නර්තන ඉතිහාස-යටත් අපූරුවට නෑකම් කියනවා. කුවේණියගේ ශාපයෙන් විජය රජු රෝගීව පසුව් මියගිය බවත්, ඉන්පසු රජ පැමිණි පඬුවස්දෙව් රජුද මේ නිසාම රෝගාතුර වූ බවත්, නර්තනය ඉතිහාසයේ සඳහන් වෙනවා. මෙම රෝගය සුව කිරීම සඳහා ඉන්දියාවේ මලය රජුන් තිදෙනා මෙරටට ගෙන්වා සෙත් ශාන්තියක් කළ බවත්, එය -කොහොඹ කංකාරිය" නමින් හඳුන්වන බවත් නර්තන ඉතිහාසයේ සඳහන් වෙනවා. උඩරට ශාස්ත්‍රීය නර්තනයේ එන පද, අඩව්, අස්නය, ආවැන්දුම, දුනුමාලප්පුව, තෝල්පාඩුව වැනි සියළුම නර්තනාංග -කොහොඹ කංකාරියේ" ඇතුලත් වෙනවා. මේ නිසාම මෙය නර්තනය හදාරන සිසුවියන්ට නර්තන ඉතිහාසය ගැන ඉගෙනීමටද උපකාරයක් වෙනවා. නර්තනයෙන් සියල්ල කියැවෙන නිසා කගක් යනතුරු මෙය කාගේත් සිත් තුල රැඳේවි.

**ඔබ කිසිවකු අනුකරණය කරනවාද? කාගේ නර්තන කලාවද ?**

මා නිර්මාණ ඉතාමත් හොඳින් රසවිඳින කෙනෙක්. එමෙන්ම ඒ නිර්මාණයන් තුල තිබෙන රසවත් සංසිද්ධි මා උකහා ගන්නවා.එසේම උසස් නිර්මාණ බිහි කරන මහා කලාකරුවන්ට මා හිසනමා ආචාර කරනවා. නමුත් මගේ නර්තන රටාව තුල මා කිසිවෙකු අනුකරණ කරන්නේ නෑ. මටම ආවේනික නර්තන රටාවක් ගොඩනැගීමට මා උතසහ කරනවා. මගේ නර්තනයන් තුලින් ප්‍රසිද්ධ නර්තන ශිල්පීන් ප්‍රේක්ෂකයාට මතක්කර දෙන්නට මා උත්සහ දරන්නේ නෑ.

**ඔබේ මෙවර ප්‍රසංගය ගැන තවදුරටත් විස්තර කරනවානම්.**

මෙම නිර්මාණයේ සියලුම අංග එනම් සංගීතය, ඇඳුම් පැළඳුම්, වේදිකා පසුතල හා නර්තන හැඩතල මගේම තේරීම්. මෙම නිර්මාණය මා ඉදිරිපත් කරන්නට සූදානම් වුනේ 2009 ප්‍රසංගයේදීයි. නමුත් එහිදී පැන නැගුණු සංගීතමය ගැටළු සහගත තත්වයක් නිසා එය පසෙකට කරන්නට මහ සිදුවුනා. සංගීත කණ්ඩවලදී මා හෙන්රි ජයසේනයන්ගේ කුවේණි නාට්‍යයේ එක් ගීතයකුත්, ශ්‍රී ලංකාවේ දක්ෂ සංගීත අධ්‍යක්ෂවරයකු වන ජනනාත් වරකාගොඩ හා සමන් පනාපිටිය මහතාගේ නිර්මාණයනුත් මේ සඳහා ආශ්‍රය කොට ගත්තා.

එසේම වේදිකා පරිපාලනය, වේදිකා සැරසිලි, ආලෝකකරණය හා ශබ්ද පරිපාලනයත් වේදිකා පසුතල රූපකරණයත් යන අංශවලින් මෙල්බන්හි අතිදක්ෂ ශිල්පින් මට සහයෝගය දක්වනවා. එමෙන්ම සියළුම ග්‍රැෆික් කලාවන් සිත්ගන්නාසුළු ලෙස නිමාකොට දුන් වරුණ සාවින්ද සොයුරාටත්, වීඩියෝ දර්ශනතල වලින් සහය දෙන නිමල් අල්විස් මහතා, හේදයකින් තොරව මේ සඳහා මට සහය දෙන සියලුම මුද්‍රිත හා ගුවන්විදුලි මාධ්‍ය ආයතනවලටත් මගේ කෘතඥතාව පුදකර සිටිනවා.

මෙවන් නිර්මාණ කාර්යයක් කිරීමේදී ස්තූති කළයුතු බොහෝ දෙනෙක් ඉන්නවා. ප්‍රථමයෙන් මෙම නිර්මාණයට දායකත්වය දක්වන දූ දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් තුල මේ සඳහා විශාල කැපවීමක් උනන්දුවක් තිබෙනවා. ඔවුන් නොවන්නට මගේ හිතේ ඇඳෙන නිර්මාණ ඔබ හමුවට දායක කරන්නේ කවුද ? එසේම මගේ මේ ප්‍රයත්නයට මට අතහිත දෙන සෑම දෙනෙකුටම මගේ ස්තූතිය පුද කරනවා.

**ඔබගේ ඉදිරි බලාපොරොත්තු මොනවාද ?**

විශ්ව රංගායතනය තුලින් මා ඉතා හොඳ ශිල්පීන් මෙල්බන් වේදිකාවට දායකකොට තිබෙනවා. මෙල්බන් වේදිකාව තුල අද බොහෝ දක්ෂතා පෙන්වන රංගන ශිල්පීන්ගේ මූලික අඩිතාලම වැටුනේ මා ඇසුරින්. ඒ ගැන මා හදවතින්ම සතුටු වෙනවා.

විශ්ව රංගායතනයෙන් විශාල සමාජ මෙහෙවරක් සිදු වෙනවා. අවශ්‍ය ඕනෑම විටක සමාජ සත්කාර සඳහා කෙරෙන ඕනෑම කටයුත්තකට සහයෝගය දක්වන්න අපි සූදානම්. එමෙන්ම මතුවටත් මගේ දැනුමින් සිසු දරුවන්ගේ කුසලතා ඔප් නැංවෙන ප්‍රසංග සංවිධානය කරමින්, ඔවුනට නර්තනයේ නියම ශාස්ත්‍රීය පදනමක් ලබාදෙමින් මා මේ ගමන ඉතා නිහඬවම ඉදිරියට යනවා.

